# සිංහල පුවත්පත් කතුවැකියේ බී.ඒ. සිරිවර්ධන ලකුණ පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
08 APR 2013
UNIVERSITY OF KELANIYA

FGS/MACO/MC/08/018



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 807 |
| වර්ග අංකය: | |



කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ජනසන්නිවේදනය
පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2011

# නිබන්ධ සාරාංශය (Abstract)

පත්‍ර කලාවේදියෙක් ලෙස සිංහල පුවත්පත් ඉතිහාසය තුළ සුවිශේෂී ස්ථානයක් හිමිකරගත් අයෙකි බී. ඒ. සිරිවර්ධන. ලේක්හවුස් ආයතනයේ ''දිනමිණ'' පුවත්පතෙන් පත්‍ර කලාවට පිවිසි හෙතෙම කොමියුනිස්ට් පක්ෂ දේශපාලනය සමඟ බැඳුණු ''ඇත්ත'' පුවත්පතට සම්බන්ධවීම ඔහුගේ මාධ්‍ය ජීවිතයේ සුවිශේෂ කඩඉමක් බවට පත් විය. නිර්ධන පාංතික දේශපාලනය සමග ඒකාබද්ධ වූ කොමියුනිස්ට් පක්ෂ දේශපාලනයේ ප්‍රගතිශීලී හඬ බවට පත් වූයේ ඇත්ත පුවත්පතයි. එහිදී ''ඇත්තේ'' ප්‍රධාන කර්තෘවරයා ලෙස වැඩි කලක් සේවය කළ බී. ඒ. සිරිවර්ධනයන්ගේ ලේඛන කලාව කැපී පෙනේ. ඇත්ත පුවත්පතෙන් කැපී පෙනුණේ කොමියුනිස්ට් පක්ෂ දේශපාලන දර්ශනයට වඩා බී. ඒ. සිරිවර්ධනයන්ගේ ප්‍රගතිශීලී ලේඛන කලාවේ පෞරුෂයයි.

ඇත්ත පුවත්පත 1964 දී ආරම්භ වන්නේ එවකට පැවති දිනමිණ, සිළුමිණ, ලංකාදීප වැනි ජාතික පුවත්පත් එ.ජා.ප හිතවාදී පිළිවෙතක කටයුතු කිරීමත් විකල්ප මතවාදයකට සමාජය තුළ පැවති ප්‍රබල ඉඩකඩත් නිසාය. එම හිඩැස තුළ මැනවින් ස්ථානගතවීමට ඇත්ත පුවත්පතට අවකාශ සැලසුණි.

ඇත්තේ ප්‍රධාන කතුවරයා වූ බී. ඒ. සිරිවර්ධනගේ ලේඛන ශෛලිය සිංහල පුවත්පත් කතුවැකි කලාවේ ප්‍රබල සලකුණක් වේ. ඔහු භාවිතා කළ භාෂාව තුළ වූ ප්‍රාණවත් භාවයත් අර්ථ පූර්ණ භාවයත්, සටන්කාමී භාවයත් නිසා පුවත්පත පාඨකයා අතර අතිශයින් ජනප්‍රිය විය. සිරිවර්ධන කොමියුනිස්ට් පක්ෂ දේශපාලනය සමග බැඳී සිටි අයෙක් වුව ද එම පක්ෂයේ සහයෙන් පිහිටුවා තිබූ සමගි පෙරමුණු ආණ්ඩුවේත් එ.ජා.ප. ආණ්ඩු වලත් වැරදි දූෂිත තැන් එළිදරව් කිරීමේදී ස්වාධීන ලෙස ක්‍රියා කළ බව ද පැහැදිලිය. ඔහු නිරතුරුවම කියූ කරුණක් වූයේ තමන් නිර්ධන පාංතික දේශපාලනයේ මිතුරෙක් වන බවයි. එම පසුබිම තුළ කවර ආණ්ඩුවක් විසින් ජනතා ද්‍රෝහී ක්‍රියාවක් සිදු කළ ද එය විවේචනය කිරීමට පසුබට නොවීය. එසේම කාලීන සමාජ ආර්ථික සංස්කෘතික සිදුවීම් හා ප්‍රවණතාවන් වලදී ද ප්‍රගතිශීලී ලෙසත් ඍජු ලෙසත් තම අදහස් එළි දැක්වීමට ඔහු තම කතුවැකි හරහා උත්සාහ දරා ඇත.

මෙම පර්යේෂණ නිබන්ධය තුළින් උත්සාහ දරා ඇත්තේ ඇත්ත පුවත්පත බිහි වූ ආකාරය හා එහි විකාශනය සිදු වූ ආකරය පැහැදිලි කර ගනිමින් එහි ප්‍රධාන කර්තෘවරයා ලෙස බී. ඒ. සිරිවර්ධන පෙන්නුම් කළ විශේෂතා හඳුනා ගැනීමටයි. එහිදී සිරිවර්ධනයන්ගේ භාෂාවේ පැවැතුණු සුවිශේෂත්වය මෙන්ම මතවාදීමය වශයෙන් ඔහු පෙන්නුම් කළ ලක්ෂණ ද අධ්‍යයනයට ලක් කෙරේ. භාෂාවේදියෙක් ලෙසත් පත්‍ර කලාවේදියෙක් ලෙසත් කීර්තියට පත් මුනිදාස කුමාරතුංගයන්ගේ භාෂා භාවිතය හා ඔහුගේ මතවාද සමඟ තුලනය කරමින් සිරිවර්ධනයන්ගේ සුවිශේෂත්වය විග්‍රහ කෙරේ. සිරිවර්ධනයන් මාක්ස්වාදී දේශපාලන දැක්මක් සහිත වූවෙක් වන අතර කුමාරතුංගයන් ඊට ඉඳුරාම වෙනස් ස්වදේශිකත්වය මත පදනම් වූ දැක්මක් සහිත අයෙක් විය. එසේ වූව ද කුමාරතුංග වඩා ප්‍රබුද්ධ ලෙසත් ප්‍රගතිශීලී ලෙසත්

සමාජ ප්‍රශ්න දෙස බැලූ අයෙකි. ඒ අනුව ඔවුන් දෙදෙනාගේ ම පුවත්පත් භාවිතාව තුළ අතිශයින්ම සමානකම් රැසක් හඳුනා ගැනීමට හැකියාව ලැබේ. භාෂාව, සාදාචාර සම්පන්න දේශපාලනය, අධිරාජ්‍ය විරෝධී අරගලය, යන අංශයන්හිදී එම සමානකම් බෙහෙවින්ම කැපී පෙනේ. කුමාරතුංග මතවාදය වඩාත් සටන්කාමී හා සජීවී ස්වරයකින් ජනතාව වෙත ගෙන යාමේදී බී. ඒ. සිරිවර්ධනයන් පෙරමුණ ගත්තා බව පැහැදිලිය. ඔහු සුවිශේෂ වන්නේ ඔහු තුළ පැවති භාෂා ඥානය මෙන් ම මාක්ස්වාදී දේශපාලන අවබෝධය තුළින් මුවහත් වූ ප්‍රගතිශීලීබව ද නිසාය. එසේ ම පුවත්පත තුළින් සමාජය වෙත මතවාදී බලපෑමක් යොමු කිරීමේදී ද සිරිවර්ධන පුරෝගාමී කාර්ය භාරයක් ඉටු කොට තිබේ.

"ඇත්ත" පුවත්පතට සැපයූ බී. ඒ. සිරිවර්ධනයන්ගේ කතුවැකි සහ "ලක්මිණි පහණ" පුවත්පතට සැපයූ කුමාරතුංග මුනිදාසයන්ගේ කතුවැකි ද අධ්‍යයනයට ලක් කරමින් සිංහල පුවත්පත් කතුවැකි කලාවේ බී. ඒ. සිරිවර්ධන ලකුණ තුලනාත්මකව පැහැදිලි කරගැනීමට (Comparative study) මෙම අධ්‍යයනය තුළින් උත්සාහ දරා ඇත.